# ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව

## ඇබෑර්තු

01. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර අධ්‍යක්ෂ - තනතුරු 01
02. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී - තනතුරු 01
03. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර - තනතුරු 02

ඉහත තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනම මත අයදුම්පත් කැඳවනු ලැබේ.

### 01. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර අධ්‍යක්ෂ (1 පන්තියේ III ශ්‍රේණිය)

**අධ්‍යාපන සුදුසුකම් :**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ පරිගණක විද්‍යාව/ තොරතුරු තාක්ෂණය/ පරිගණක ඉංජිනේරු විද්‍යාව හෝ පරිගණක තාක්ෂණයට අදාළ උපාධියක් ලබා තිබීම.

**හෝ**

2. (I) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ උපාධියක් ලබා තිබීම. (මෙහිදී සම්පූර්ණ උපාධි පාඨමාලාවෙන් අවම වශයෙන් 1/3 කොටසක් පරිගණක විද්‍යාව/ තොරතුරු තාක්ෂණය පිළිබඳව විය යුතුය)

**සහ**

(II) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ පරිගණක විද්‍යාව/ තොරතුරු තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම.

**හෝ**

3. (I) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තොරතුරු තාක්ෂණය පිළිබඳ අවම වශයෙන් ජාතික වෘත්තීය කුසලතා (NVQ) හත (07) මට්ටමේ ප්‍රවීණතාවයක් ලබා තිබීම.

**සහ**

(II) අදාළ ක්ෂේත්‍රයේ වසර දෙකක (02) වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.

**වැටුප් පරිමාණය :** රා.ප.ච 10/2025 අනුව මාසික දීමනාව (සියලු දීමනා ඇතුළත් මාසික දීමනාව)
**රු.92,238/- (74,438/- +17,800/-)**

### 02. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී (2 පන්තියේ II ශ්‍රේණියේ)

**අධ්‍යාපන සුදුසුකම් :**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ පරිගණක විද්‍යාව/ තොරතුරු තාක්ෂණය පිළිබඳ උපාධියක් ලබා තිබීම.

**හෝ**

2. (I) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණය ප්‍රධාන විෂයක් සහිත උපාධියක් ලබා තබීම. (මෙහිදී සම්පූර්ණ උපාධියෙන් අවම වශයෙන් 1/3 කොටසක් පරිගණක විද්‍යාව/ තොරතුරු තාක්ෂණය පිළිබඳව විය යුතුය)

**සහ**

(II) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම.

**හෝ**

3. (I) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ උපාධියක් ලබා තිබීම.

**සහ**

(II) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ පරිගණක විද්‍යාව/ තොරතුරු තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

**හෝ**

4. (I) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තොරතුරු තාක්ෂණය පිළිබඳ අවම වශයෙන් ජාතික වෘත්තීය කුසලතා (NVQ) හත (07) මට්ටමේ ප්‍රවීණතාවයක් ලබා තිබීම.

**සහ**

(II) අදාළ ක්ෂේත්‍රයේ වසර දෙකක (02) වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.

**වැටුප් පරිමාණය :** රා.ප.ච 10/2025 අනුව මාසික දීමනාව (සියලු දීමනා ඇතුළත් මාසික දීමනාව)
**රු.75,430/- (57,630/- +17,800/-)**

### 03. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර (3 පන්තියේ III ශ්‍රේණියේ)

**අධ්‍යාපන සුදුසුකම් :**

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයෙන් භාෂාව, ගණිතය සහ ඉංග්‍රීසි භාෂාව ඇතුළු සම්මාන පහක් (05) සහිතව විෂයන් හයකින් (06) එකවර සමත්වීම.

**වෘත්තීය සුදුසුකම් :**

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අවම වශයෙන් ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (05) මට්ටමේ හෝ ඊට ඉහළ පරිගණක/ තොරතුරු තාක්ෂණ පාඨමාලාවක් හදාරා තිබීම.

**වැටුප් පරිමාණය :** රා.ප.ච 10/2025 අනුව මාසික දීමනාව (සියලු දීමනා ඇතුළත් මාසික දීමනාව)
**රු.65,178/- (47,378/- +17,800/-)**

**සියලුම තනතුරු සඳහා පොදු කොන්දේසි :**

**වයස :** අයදුම්කරුවන් වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 65 ට නොවැඩි විය යුතුය.

**සේවා නියුක්ති කොන්දේසි :** පවතින පුරප්පාඩු ස්ථිර පදනමින් පුරවන තෙක් හෝ වසර දෙකක (02) කාල සීමාවක් සඳහා වන දෙකෙන් පළමුව එළඹෙන දිනය දක්වා කොන්ත්‍රාත් පදනම මත අනුයුක්ත කරනු ලැබේ.

**බඳවා ගැනීමේ ක්‍රමය :** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරා ගනු ලැබේ.

**අයදුම්පත් භාරගැනීමේ අවසන් දිනය :** 2026.04.25

පත්වීමක් සිදු කිරීමේ හෝ නොකිරීමේ අයිතිය ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව සතුවේ.

අයදුම් කරන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කළ යුතුය.

අයදුම්කරුවන් තම සම්පූර්ණ ජීව දත්ත පත්‍රිකාව සහ ඥාති නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ (02) නම්, ලිපිනය, දුරකථන අංකය සමග තම අයදුම්පත්‍රය අදාළ දින හෝ ඊට පෙර පහත ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

**සුරාබදු කොමසාරිස් ජනරාල්,**
**ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව,**
**අංක 353, කෝට්ටේ පාර,**
**රාජගිරිය.**

SELACINE